**ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ 177 වැනි වාර්ෂික මහා සම්මේලනයේදී ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කෙශාප් මහතා පවත්වනු ලැබූ කථාව**

**ඕක් ශාලාව, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය කොළඹ, ශ්‍රී ලංකාව**

**2016 ජූනි 28 අඟහරුවාදා**

නෝනාවරුනි මහත්වරුනි, ඔබ සැමට සුභ සැන්දෑවක්. ශ්‍රී ලංකාවේ පැරණිතම සහ වඩාත් බලවත්ම ව්‍යාපාරික සංවිධානය වන ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ 177 වැනි වාර්ෂික මහා සම්මේලනයට සහභාගී වීමට හැකිවීම පිළිබඳව මම මහත් සතුට පත්වෙනවා. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගීවීමට මා හට ආරාධනා කිරීම මහත් ගෞරවයක් ලෙස සලකනවා.

මෙම ප්‍රතාපවත් සංවිධානය පාලනය කිරීම සඳහා සභාපති රණතුංග මහතා සහ සෙසු නිලධාරීන් තවත් වසරක කාලයක් සඳහා නැවතත් තේරීපත්වීම පිළිබඳව මාගේ සුභාශිංසන පුදකරමින් මාගේ කතාව ආරම්භ කරනවා. ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් විවිධවූ අවස්ථාවන් රැසක් උදාවී තිබෙන මේ මොහොතේ රටට දීප්තිමත් අනාගතයක් අත්කර දීම සඳහා වාණිජ මණ්ඩලයට ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටු කළ හැකිවේ.

ශ්‍රී ලංකාවේ මෙම පරිනාමනය ආරම්භ වූයේ ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතිවාසිකම්, විනිවිදභාවයෙන් යුක්ත රාජ්‍යපාලනයක් සහ දූෂණය මුලිනුපුටා දැමීම සඳහා වූ ප්‍රතිශෝධනයන් ක්‍රියාවට නැංවීම සඳහා 2015 ජනවාරි මාසයේ දී ඡන්දායකයින් ජනාධිපති සිරිසේනට බලය ලබාදීමත් සමගින්ය. අගමැති රනිල් වික්‍රමසිංහගේ නායකත්වය යටතේ ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය වෙනුවෙන් කැපවුන බවට පොරොන්දු වූ සංධානයට පසුගිය අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුවේ බහුතරය ආසන ගණනක් ලබාදීම තුළින් ශ්‍රී ලාංකීය ජනතාව මෙම ප්‍රතිශෝධන න්‍යායපත්‍රයට තම සහාය දක්වන බව නැවතත් පැහැදිලිවම තහවුරු කර තිබේ.

නීතියේ ආධිපත්‍ය, සාධාරණත්වය සහ ආර්ථික අවස්ථාවන් සැමටම සමානව භුක්ති විඳිය හැකිවීම ආදිය සම්බන්ධයෙන් දක්වන ලද කැපවීම තුළින් ශ්‍රී ලංකාවේ රජය අඳුරු අතීතයෙන් ඔබ්බට ගොස් සියලුදෙනා අන්තර්ගතවූ සාධාරණ, සාමකාමී සහ සෞභාග්‍යමත් අනාගතයක් කරා පියමනිමින් සිටී. අන්තර්ජාතික ප්‍රජාව මෙම ධනාත්මක දැක්ම අගය කරමින් ශ්‍රී ලංකික ජනතාවට ඉමහත් සහයෝගයක් දක්වමින් කටයුතු කරනු ලබයි.

නෝනාවරුනි මහත්වරුනි, ඉතිහාසයේ අතීතයේ නොවී විරූ ආකාරයට ශ්‍රී ලංකාව හා ඇමෙරිකාව අතර සම්බන්ධතා අදවන විට වර්ධනය වී තිබෙන බව මා සතුටින් සඳහන් කරනවා. ජනාධිපති සිරිසේන සහ අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ ප්‍රමුඛ රජය අත්‍යාවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන, ජාතික සංහිඳියාව සහ එක්සත්ජාතීන්ගේ සම්මුතීන්ට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවන් සම්පූර්ණ කරමින් ඉදිරියට ගමන් කරන්නා වූ මේ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැවත ගොඩනැංවීමට, යහපාලනය නංවාලීමට සහ සියලුම ශ්‍රී ලංකිකයින්ට සමාන අයිතිවාසිකම්, සමාන අවස්ථාවන් සහ ජාතිකත්වය සම්බන්ධයෙන් කිසිදු වෙනස් නොමැතිව පශ්චාත් යුධ සංවර්ධන ප්‍රතිලාභ අත්කර ගැනීමට අවස්ථාව සලසාදීමට එක්සත් ජනපදය නොසැලී අඛන්ඩ සහයෝගය ලබාදීමට කටයුතු කරනවා.

**ශ්‍රී ලංකාව සමගින් වූ ඇමෙරිකානු පාර්ශවකරණය**

එක්සත් ජනපදය පසුගිය වසර 60 වසර පුරා ශ්‍රී ලංකාවට සංවර්ධන සහ මානුෂීය සහාය ලබාදේ. මෙම ආධාර සුවහසක් ශ්‍රී ලාංකික ජනතාවකගේ ජීවන තත්වයන් ඉහළ නැංවීමට උපකාරී වී තිබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, ව්‍යවසාය සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය සත්කාර, බලශක්තිය සහ ස්වභාවික සම්පත්, යහපාලනය හා මානුෂීය ක්‍රියාකාරකම් යනාදී සියලුම ක්ෂේත්‍රයන්හි අපි සුවිශාල ආයෝජනයන් සිදුකර තිබෙනවා.

මෙම වසරේදී එක්සත් ජනපදය ඇමෙරිකානු ඩොලර් මිලියන 40 ක ආධාර ශ්‍රී ලංකාවට ලබාදෙන අතර ඉදිරි වසර සඳහාත් මේ හා සමාන ආධාර ලබාදෙන ලෙස අපි ඉල්ලීමක් කර තිබෙනවා. ශ්‍රී ලංකාවේ රජය යහපාලනය සම්බන්ධයෙන් දක්වන කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිලෙනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ප්‍රතිශෝධනයන්ට පහසුකම් සැලසීමට අමතරව ඩොලර් මිලියන ගණනාවක් ලබාගැනීමට අවස්ථාවන් උදාකරන වැඩසටහනක් ශ්‍රී ලංකාවට ලබාදීම සඳහා වූ ඇගයීම් වල නියැලී සිටිනවා.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා වූ අපගේ ප්‍රයත්නයන් මූල්‍යමය සහයෝගයන්ට පමණක් සීමාවූවක් නොවේ. මේ වසරේදී මෙම කාලසීමාව තුළදී අනාගතයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විශාල වශයෙන් ව්‍යාප්ත වීමට ඉඩප්‍රස්ථා පවතින්නාවූ සංචාරක හා බලශක්ති කර්මාන්ත අංශයන්හි යහභාවිතයන් සම්බන්ධයෙන් පුහුණුවක් පෞද්ගලික අංශයේ විධායක නිලධාරීන් සහ රජයේ නිලධාරීන් 50 කට වැඩි සංඛ්‍යාවකට ලබාදීමට කටයුතු කර තිබෙනවා.මෙයට අමතරව ශ්‍රී ලංකාවේ රේගුවේ සහ වෙනත් ආයතනවල නිලධාරීන් 100 කට වැඩි සංඛ්‍යාවකට ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රඥප්තීන් සහ ඒ හා සම්බන්ධ කරුණු පිළිබඳව පුහුණු ලබාදී තිබෙනවා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රවීනත්වයන් වර්ධනය කිරීමටද අපි කටයුතු කරනවා. එසේම අපි ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමට සහ සේවායෝජකයින්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට ශ්‍රමිකයින්ගේ කුශලතාවයන් නංවාලීම සඳහා වූ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා දේශීය සහ විදේශීය ප්‍රවීනයන්  සම්බන්ධ කරගන්නෙමු.

පසුගිය පෙරවාරි මාසයේදී පළමු වටය නිමාවට පත්වූ එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර පාර්ශවකරණය පිළිබඳව සාකච්ඡාවන් අප දෙරට අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා වූ තවත් එක් මාවතකි. මෙම සාකච්ඡාවන් ප්‍රධාන කරුණු 4 ක් ඔස්සේ සිදුවූ අතර මේවායින් එකක් ලෙසට ආර්ථික සහයෝගීතාවය සැලකිය හැකිය. මේ යටතට කාන්තාවන් සවිබල ගැන්වීම සහ ආයෝජනයන් දිරිගැන්වීමද ඇතුළත්වේ. එක්සත් ජනපද ශ්‍රී ලංකා වෙළඳ සහ ආයෝජන වැඩසැලසුම් සහා රුස්වීම (TIFA) අප්‍රියෙල් මාසයේ දී වොෂින්ග්ටන් නුවරදී පැවැත්වීම සඳහා අප අනුග්‍රහය ලබාදුන් අතර මෙමගින් අපගේ වෙළඳ සහ වාණිජ සම්බන්ධතාවන් තවදුරටත් වැඩි දියුණු කරනු ඇත.

**ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා දීප්තිමත් දැක්මක්**

දිනෙන් දින ශක්තිමත්වන අපගේ සම්බන්ධතාවය තුළින් ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ වල සංචාරය කිරීමට මා හට අවස්ථාව උදාවි තිබේ. අපි විසින් දැනට ලබාදෙන සහයෝගය තුළින් ඇතිවී තිබෙන බලපෑම සහ තවදුරටත් සහයෝගය ලබාදිය යුතු ක්ෂේත්‍ර පිළිබඳව අවබෝධ කරගැනීමට මෙමගින් අවස්ථාව සලසනු ලබයි. ශ්‍රී ලංකාවේ ශක්තිමත් මානව සහ භෞතික ප්‍රාග්ධනය තුළ පවතින්නාවූ අතිවිශාල ආර්ථික හැකියාව සහ සීග්‍රයෙන් දියුණුවට පත්වෙමින් තිබෙන හා ගතිකත්වයෙන් යුත් කළාපයක ක්‍රමෝපායික වශයෙන් වැදගත් පිහිටීම තුළින් ඇතිවන්නාවූ වාසි සහගත තත්වයන් පිළිබඳව මම මහත් ප්‍රබෝධයට පත්වුනෙමි. ත්‍රිකුණාමළය, යාපනය, හම්බන්තොට, කොළඹ හෝ කොළඹ අවට ප්‍රදේශ යනාදී ඕනෑම ප්‍රදේශයක සංචාරය කරන විටදී ජාතිකත්වය හෝ ආර්ථික සමාජයීය පසුබිම් පිළිබඳව තැකීමක් නොකර ශ්‍රී ලංකිකයින් ලෙස කටයුතු කිරීමෙන් මෙම රටට කොතරම් දියුණුවක් ලබාගත හැකිදැයි මම කල්පනා කරමි.

මිත්‍රවරුනි, ජාතිකත්වය කුමක් වුවත් සෑම ළමයකුටම රජයේ ඕනෑම ඉහළ තනතුරක් දැරියහැකි ශ්‍රී ලංකාවක් පිළබඳව සිතන්න. මුස්ලිම් ළමයකුට යුධ හමුදාවට නායකත්වය ලබාදීමට පිළිබඳ ඇයගේ සිහිනය සැබැකරගත හැකි ලංකාවක් ගැන සිතන්න. දෙමළ  ළමයකු ජනාධිපති විය හැකි ශ්‍රී ලංකාවක්, සිංහල ළමයකුට වරප්‍රසාද හිමිවන, සෞභාග්‍යමත් ඵලදායී රැකියාවක්, ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සහ මූල්‍යමය සුරක්ෂිතතාවය ලබාගැනීම සඳහා විදේශයකට යාමේ අවශ්‍යතාවක් නොමැති තත්වයන් ගැන සිතන්න.

මිත්‍රවරුනි, තරුණයකුට ව්‍යාපාරයක් ආරම්භ කර, ව්‍යවසායකයකු විය හැකි, කාර්යය මණ්ඩලයක් කළමනාකරණය කරමින් ව්‍යාපාරික කටයුතු මෙහෙයවමින් සාර්ථකත්වයට පත්විය හැකි තත්වයන් සහ

අවම නීතිමය බාධාවන් සහ රෙගුලාසි අවම වූ විනිවිදභාවයෙන් යුත් ව්‍යාපාරික අවස්ථාවන් දිරිගන්වන නිලබල ක්‍රමයක් හා ආයතන පිළිබඳව අපට සිතිය හැකිද?

මිත්‍රවරුනි, තරුණයකුට කොළඹින් කාරයකට නැගී පැය තුන හතරකින් ත්‍රිකුණාමලයට හෝ යාපනයට ගමන් කළහැකි තත්වයන් පිළිබඳව සිතන්න. දිවයින අභ්‍යන්තරයේ ජනගහනය වැඩි වශයෙන් සිටින ස්ථාන එකිනෙක සම්බන්ධ කරමින් දිවෙන රජය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරණයෙන් ඉදිකරන ලද උසස් තත්වයේ අධිවේගී මාර්ගවලින් සමන්විතවූ තත්වයක් පිළිබඳව සිතාබලන්න . රටේ සිව් කොනම සම්බන්ධ කරමින් මගීන්ට සහ භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සලසන්නාවූ නවීනතම දුම්රිය මාර්ග පද්ධතියක්, ආසියානු සහ මැදපෙරදිග වෙළඳ පොළවල් සමග සියලුම අන්තර්ජාතික වරායන් සම්බන්ධ කරන දුම්රිය මාර්ග පද්ධතියක් ගැන සිතන්න. දැනට ගෝලීය වෙළඳ පොළෙන් ඉතා දුරස්ව සිටින්නාවූ ජනතාවට සෞභාග්‍යය සහ සම්බන්ධතාවන් අත්කර දෙන්නාවූ ආකාරයට මගී සහ භාණ්ඩ ප්‍රවාහන ගුවන් තොටුපළවල් රටේ සියලුම ප්‍රදේශ පිහිටා තිබෙන තත්වයක් ගැන සිතන්න.

අනාගත ආර්ථික වර්ධනය සඳහා ශ්‍රී ලංකාව යටිතල පහසුකම් ගොඩනැගීම සම්බන්ධයෙන් අවධානය යොමුකරන විට රජයට සහ පෞද්ගලික අංශයට ලෝකයේ වඩාත් දියුණු ආර්ථිකයන් විසින් ආදර්ශ කොට ගන්නා ලද පෞද්ගලික සහ රජයේ පාර්ශවකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමට සිදුවිය හැකිය. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරණය මගින් මෙම යටිතල පහසුකම් නංවාලීම සඳහා අවශ්‍ය වන්නාවූ රාජ්‍ය අරමුදල් ප්‍රමාණවත් නොවන විට ඒ සඳහා පෞද්ගලික අංශයේ මූල්‍ය සහ ව්‍යාපෘති සැකසීම, ක්‍රියාවට නැංවීම සහ කළමනාකරණයට අවශ්‍ය සහාය ලබාගත හැකිය. මෙම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘතීන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක සහ සංකීර්ණ එකක් වන අතර මේවායේ සාර්ථකත්වය රඳාපවත්නේනේ ඒ සඳහා සාධනීය වාතාවරණයක් පැවතීම තුළිනි.

මිත්‍රවරුනි, මෙම කළාපයේ වැදගත්ම සහ ප්‍රමුඛතම කාර්යය සම්පාදන සහ ප්‍රවාහන මධ්‍යස්ථානය බවට ශ්‍රී ලංකාව පත්වී සිටිනේ යැයි සිතන්න මෙම ආර්ථික කාර්යයන්ට ජවය දෙනු ලබන්නේ වෙළඳපොළ ක්‍රමය මගින් තීරණයව කරන්නාවූ මිශ්‍ර බලශක්ති මූලාශ්‍රයන් මගින් යැයි සිතාගන්න. මෙහි කොඳුනාරටිය වන්නේ පුනර්ජනනීය බලශක්තියයි. ස්වාධීන බලශක්ති සම්පාදකයින් සඳහා අවකාශය ලබාදෙන විදුලි සම්ප්‍රේෂණ පද්ධතියක් පිළිබඳව සිතන්න.

හම්බන්තොට හෝ ත්‍රිකුණාමලයේ පිහිටා ඇති විශේෂ ආර්ථික කළාප මගින් කොතරම් සෞභාග්‍යයක් උදාකරගත හැකිද? ආයෝජන සීමාකරන්නාවූ නීතිරීති වලින් නිදහස්ව පෞද්ගලික ව්‍යවසායකයින්ට මෙම කළාප වල මෙහෙයුම් කිරීමට ඉඩ ලබාදීම තුළින්, පෞද්ගලික අංශයට වඩාත් හොඳ ව්‍යාපාරික කටයුතු පිළිබඳව තීරණයකට එළැඹිය හැකි අතර එමගින් සෘජු විදේශ ආයෝජන මගින් උත්පාදනය වන රැකියා අවස්ථාවන් උදාකර ගත හැකිවනු ඇත. එවැනි විශේෂ ආර්ථික කළාපයන්ට ලෝක මට්ටමේ පවත්නා තරගකාරී භාවිතයන් සහ රෙගුලාසි උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකික හා විදේශ සමාගම් වලට දිවයිනේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් පිහිටීම හා මානව ප්‍රාග්ධනය යොදාගනිමින් දකුණු සහ ගිණිකොන දිග කළාපයේ අනෙකුත් රටවල් සමග තරග කළ හැකි කාර්යක්ෂම ව්‍යවසායන් බිහිකිරීමට හැකිවනු ඇත.

තරුණ ශ්‍රී ලාංකිකයින් තමන්ගේ දක්ෂතා හා කුශලතාවන් තම රටේදීම භාවිතා කරමින් ඔවුන්ගේ රට වෙනුවෙන් ආයෝජනය කිරීමට, රැකියා උත්පාදනයට සහ නව වත්කම් උපයා ගැනීමට වැඩි කැමැත්තක් දක්වන බව මම විශ්වාස කරමි. දක්ෂතාවන් රඳවා ගනිමින් සහ සංවර්ධනය කරමින් සහ ආසියානු පැසිෆික් කළාපයේ ශ්‍රම වෙළඳ පොළ හා තරගවැදීමට හැකි අයුරින් තම තම්කරු ප්‍රමිතීන් වර්ධනය කරගැනීම මගින් ශ්‍රී ලංකාවට තොරතුරු තාක්ෂණ සේවා, උසස් තතවයේ වෛද්‍ය ප්‍රතිකාර සේවා සහ මූල්‍ය සේවාවන් ඉහළම මට්මමින් ස්ථාපිත කරගත හැකිය. ඉතා උසස් මට්ටමේ යටිතල පහසුකම් හා විවිධත්වයෙන් යුත් ශ්‍රම බලකායක් ශ්‍රී ලංකාව පුරා ඕනෑම අවස්ථාවක සේවය කිරීමට සූදානම්ව සිටින තත්වයන් පිළිබඳව සිතන්න.

**පරිපූර්ණ ප්‍රතිපත්ති වාතාවරණකින් ඇති වන්නාවූ ප්‍රතිලාභ**

නෝනාවරුනි මහත්වරුනි, මේ අරමුණු ලගාකරගැනීම සඳහා ඉතා වැදගත්වන්නේ ශ්‍රමිකයින්ට, රජයට සහ පෞද්ගලික අංශයට හිතකාමී, පරිපූර්ණ විශ්වාසය තැබිය හැකි ස්ථාවර ආර්ථික ප්‍රතිපත්තීන් වලින් සමන්විත දැක්මක් තිබීමයි. පෞද්ගලික අංශයට මනාව ක්‍රියාත්මක හැකි සාධාරණ වාතාවරණයක් සකසමින් එතුලින් රජයට අවශ්‍ය වන්නාවූ බදු මුදල් එක්රැස් කිරීමට රජය සතු ආයතන වලට සහාය දැක්විය හැකියි. ආසියා පැසිෆික් කළාපයේ  ඉහළ මට්ටමේ ආර්ථිකයන් පවතින්නාවූ රටවල ක්‍රියාත්මක වන වඩාත් හොඳ ආර්ථික ප්‍රතිපත්ති අනුව රජයේ ආර්ථික ප්‍රතිපත්තිය සැකසීමෙන් හා ක්‍රියාවට නංවමින්, නීති සහ රෙගුලාසි ලිහිල් කරමින් පෞද්ගලික අංශයට වඩාත් හොඳින් ක්‍රියාත්මක වීමට ඉඩසලසමින් මෙම දැක්ම ලගාකරගැනීම සඳහා රජයට පහසුකම් සැලසිය හැකිය. පහසුවෙන් තේරුම්ගත හැකි සහ විනිවිදභාවයෙන් යුත් රෙගුලාසි සමගින් කටයුතු කිරීමට නීත්‍යානුකූල ව්‍යාපාර සෑම අවස්ථාවකම සූදානමින් සිටී.

මෙම දැක්ම යථාවක් බවට පත්කරගැනීමේදී  වඩාත් දුෂ්කර කරුණ වන්නේ විදේශ ආයෝජන ප්‍රමාණවත් නොවීමයි. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය ශ්‍රී ලංකාවේ ආර්ථිකය පරිනාමනය කිරීම සඳහා වූ ඔවුන්ගේ මූලධර්ම 10 හි අවධාරණය කර තිබෙන ආකාරයට “ශ්‍රී ලංකාවේ සීග්‍ර වර්ධනය ප්‍රධාන වශයෙන් විදේශීය ආයෝජන ආකර්ශනය කරගැනීම මත” රඳා පවතී. විදේශීය ආයෝජන මගින් නවතම තාක්ෂණයන් හා ව්‍යාපාරික යහභාවිතයන් ලබාගැනීමට අවස්ථාව සලසන අතර මෙය ආර්ථික සංවර්ධනයට අතිරේක බලයක් සපයනු ලබයි.

විදේශීය ඍජු ආයෝජනයන් ආකර්ශණය කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට කළාපීය වශයෙන් පවත්නා දැඩි තරගය ජයගැනීමට සිදුවේ. ඉන්දියාව බංග්ලාදේශය, වියට්නාමය, මියන්මාරය, කාම්බෝජය සහ ඉන්දියානු පැසිෆික් කළාපයේ අනෙකුත් රටවල් මෙම ආයෝජකයින් ආකර්ශණය කරගැනීමට උත්සාහ දරති. මෙම ඩොලර් ආයෝජනයන් දිනාගැනීම සඳහා ශ්‍රී ලංකාවට බදු, ප්‍රසම්පාදන තීරුබදු ගාස්තු හා දූෂණය වැළත්ව ආර්ථිකයේ සියලුම අංශයන්හි පැහැදිලි සහ ස්ථාවර ප්‍රතිපත්තීන් ස්ථාපිත කළ යුතුයි. දේශීය සහ විදේශීය ආයෝජකයින් ආකර්ශණය කරගැනීම සඳහා වඩාත් වැදගත් වන්නේ පැහැදිලි හා ස්ථාවර ප්‍රතිපත්තීන්ය. පැහැදිලි ප්‍රතිපත්ති සහ ස්ථාවරභාවය තුලින් සමානව තරග කිරීමේ අවස්ථාවන් මගින් විනිවිදභාවය සහ බලාපොරොත්තු තැබිය හැකිබව ඇතිකරන අතර මේවා ආයෝජකයින් ට අවශ්‍ය කරන්නාවූ අත්‍යාවශ්‍ය සාධක වේ.

මෙම මාසයේ මුල භාගයේදී අන්තර්ජාතික මූල්‍ය අරමුදල මගින් ශ්‍රී ලංකාවට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5 ක ණය මුදලක් සැපයීමට තීරණය කිරීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය සහාය දක්වයි. මෙමගින් රජයට අවශ්‍ය කරන්නාවූ මූල්‍ය සහ ආර්ථික සංශෝධනයන් ක්‍රියාත්මක කිරීමට මහගු අවස්ථාවක් උදාකරදේ. මූල්‍ය අරමුදල විසින් හඳුනාගන්නා ලද කෙටිකාලීන අසමතුලිතතා සහ මධ්‍යම කාලීන අභියෝගයන් වලට විසඳුම් සොයාගැනීමට ප්‍රධාන කරුණු 6 ක් මත පදනම් වූ සංශෝධන වැඩසටහනක් රජය විසින් සකසා ඇත. මේවා නම් අයවැය පරතරයක් අවම කරගැනීම, මූල්‍ය ප්‍රතිපත්තියේ සංශෝධන සිදුකිරීම, රජයේ ආදායම් ඉහළ මට්ටමට ගෙනඒම, රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිශෝධනය කිරීම, රාජ්‍ය මුදල් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ වෙළදාමට හා ආයෝජනයට සහාය දක්වීමයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවට ස්ථාවර ආර්ථිකයක් සකසා ගැනීම පමණක් නොව ඍජු විදේශ ආයෝජනයන් ආකර්ෂණය කරගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින යහපත් වාතාවරණය පිළිබඳව අන්තර්ජාතික ව්‍යාපාරික ප්‍රජාවට සංඥාවක්ද කරනු ලබයි.

ඕනෑම රටක ව්‍යාපාරික වාතාවරණයේ අත්‍යාවශ්‍ය සංරචකයන් වන්නේ අලුතින් එරටට පිවිසෙන්නන් හට ඵලදායී අන්දමින් කටයුතු කිරීමට අවස්ථාවක් ලබාදී තිබීමයි. රජය විසින් තම රට “ව්‍යාපාරික අවස්ථාවන් සඳහා විවෘත” බව දැක්වෙන පැහැදිලි හා ස්ථාවර සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන් අනුගමනය කරනු ලැබුවත් ආයෝජකයින් පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයින්ගෙන් දිරිගන්වනු සුලු අදහස් දැක්වීම් අපේක්ෂා කරනු

ලබයි. රජය සහ පෞද්ගලික අංශය, දේශිය මෙන්ම බහුජාතික විදේශීය නීත්‍යානුකූල නව ආයෝජකයින් සාදරයෙන් පිළිගත යුතුයි. මෙසේ වෙළඳ පොළට අලුතින් එක්වන්නන් නව අදහස්, ජීව ගුණය සහ සමස්ථ ආර්ථික ජීවපද්ධතියටම ප්‍රතිලාභ අත්වන තරගකාරීත්වය ලබාදිය හැකිය. විශ්වාසය තැබිය හැකි, පරිපූර්ණ සහ ස්ථාවර ආර්ථික ප්‍රතිපත්තියක් තුළින් බහුජාතික සමාගම් වලට මෙන්ම ශ්‍රී ලංකාවේ වඩාත් හොඳින් ස්ථාපිත වූ සමාගම් වලටද මහගු අවස්ථාවන් රැසක් උදාකරනු ඇත.

අදවන විට වඩාත් හොඳින් ක්‍රියාත්මක වන දේශීය සමාගම් ඔවුන්ගේ අනාගත වර්ධනය ශ්‍රී ලංකාවෙන් බාහිරව සිදුවන බව වටහාගෙන ඇති අතර ඔවුන් කළාපීය සහ ජගත් වෙළඳ පොළ වල් සොයායති. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට මෙම වෙළඳපොළ  වෙත පිවිසීමේ ප්‍රවීනතා සහ පළපුරුද්ද පවතින බැවින් විදේශ ආයෝජකයින් සාදරයෙන් පිළිගනිති. මෙම සමාගම් සහ ආයෝජකයින් සෞභාග්‍යයේ පාර්ශවකරුවන් විය හැකියි. වාණිජ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ඔබගේ රාජකාරිය වන්නේ ආර්ථික ප්‍රතිපත්ති වෙනස්කළ යුත්තේ ඇයි ද යන්න රජයට සහ ජනතාවට පැහැදිලි කරදීමයි. ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නාවූ දිගුකාලීන ආර්ථික සෞභාග්‍ය ලගාකරගැනීම සඳහා ඍජු විදේශ ආයෝජන ලබාගැනීමට ප්‍රතිපත්ති වෙනස් කිරීම් අත්‍යාවශ්‍යය.

මිත්‍රවරුනි මාගේ කථාව අවසාන කිරීමේදී එක්සත් ජනපද ආයෝජකයින් ලෝකය පුරා වඩාත් සිත්ඇදගන්නා සුලු, ඍජු හා විශ්වාසදායී ව්‍යාපාරික අවස්ථාවන්හි ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන ගණනාවක ආයෝජනයන් ආයෝජනය කර ඇති බව අවධාරණය කර සිටිමි. එක්සත් ජනපද සමාගම් ලෝකයේ කාර්යක්ෂමතාවය, නවෝත්පාදනය, තාක්ෂණය, පරිසරය සම්බන්ධයෙන් වගකීම, ආචාරධර්මානුකූල හැසිරීම, පෞද්ගනික අංශයේ සමාජ වගකීම හා සේවක සම්බන්ධතාව යන සියලු අංශයන්හි ප්‍රමුඛත්ථානය දිනාගෙන සිටී. මෙම ලෝක මට්ටමේ ඇමෙරිකානු සමාගම් විශ්වාසදායී පරිපූර්ණ හා ස්ථාවර ආර්ථික ප්‍රතිපත්තින් සහිත ජාතීන් සමග ආයෝජන කිරීමට හා වෙළඳ ව්‍යාපාර ඇරඹීමට සැමවිටදීම සූදානම්ව සිටී. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නායකත්වය සමගින් ශ්‍රී ලංකාවට එවැනි ජාතියක් බවට පත්විමට හැකි බවට මම විශ්වාස කරමි.

ස්තුතියි